**උතුරු පළාත් සභාව - 2016**

**-----------------------------**

උතුරු පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.2 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (1SSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස උතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් උතුරු පළාත් සභාවේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 හදිසි අවස්ථා අරමුදල පිළිබඳ මූල්‍ය ප්‍රකාශන

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව හදිසි අවස්ථා අරමුදලක් ස්ථාපිත කර නොතිබුණි. එබැවින්, 2017 සැප්තැම්බර් 7 දින පවත්වන ලද රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් මෙම කරුණ පිළිබඳව සොයාබලා කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට නියෝග කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පළාත් සභා අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හා පළාත් දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් 03 ක දැක්වෙන ජංගම නොවන වත්කම් වටිනාකම අතර එකතුව රු.288,202,984 ක වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුවේ නම | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | විසර්ජන ගිණුම් අනුව වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ප්‍රධාන ලේකම්, ලේකම් කාර්යාලය | 24,185,919 | 312,309,823 | 288,123,904 |
| පරිවාස හා ළමාරක්ෂක සේවා | 211,300,241 | 211,284,911 | 15,330 |
| පළාත් පාලන | 1,093,474,842 | 1,093,411,092 | 63,750 |
| | | | 288,202,984 |

(ii) සමාලෝචිත වර්ෂය තුළ කුලියට දෙන ලද ගොඩනැගිල්ල වෙනුවෙන් වවුනියා මහ රෝහල විසින් ලබාගන්නා ලද රු.900,000 ක කුලිය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(iii) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ උත්පාදනය කරන ලද රු.6,075,608 ක ආදායම, ආදායම් ගිණුමට බැර කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(iv) පළාත් පාලන ආයතන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ පළාත් සභාව විසින් රැස්කරන ලද එකතුව රු.696,040,691 ක් වූ මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් වගකීම් ලෙස දක්වනු වෙනුවට ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

**පිළිතුරු නොලත් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් පළාත් දෙපාර්තමේන්තු සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 21 කට පිළිතුරු 2017 දෙසැම්බර් 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. එම විගණන විමසුම් වලට අදාළ ගනුදෙනුවල ගණනය කළ හැකි වටිනාකම රු.5,666,807 ක් විය. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුවේ නම | පිළිතුරු නොලත් විමසුම් සංඛ්‍යාව | ගනුදෙනුවල වටිනාකම |
|---|---|---|
| | | රු. |
| අධ්‍යාපන | 19 | 2,538,504 |
| ක්‍රීඩා | 02 | 3,128,303 |
| | 21 | 5,666,807 |

### 2.2.4 ලැබිය යුතු ගිණුම්

පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් වෙනත් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට මාරුවීම් ලබාගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු එකතුව රු.18,683,434 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට පළාත් දෙපාර්තමේන්තු 18 ක් විසින් කටයුතු කර නොතිබුණි.

### 2.2.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | රු. | |
| | XIX පරිච්ඡේදය 5.4 වගන්තිය | | රජයේ නිවාසවල පදිංචි වී සිටින නිලධාරීන්ගේ වැටුප්වලින් එම නිවාස සඳහා කුලී අයකර නොතිබුණි. |
| (ආ) | උතුරු පළාත් මූල්‍ය රීති (PFR) | | |
| | පළාත් මූල්‍ය රීති 69 (i) | 1,735,000 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වාහන අනතුරු පිළිබඳ පාඩු විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |
| | පළාත් මූල්‍ය රීති 106 හා 107 | 3,794,357 | පළාත් අමාත්‍යාංශයක් හා පළාත් දෙපාර්තමේන්තු 06 ක් විසින් අදාළ නිලධාරීන්ගේ අනුමැතිය හා සහතික කිරීමෙන් තොරව එකතුව රු.3,794,357 ක ගෙවීම් සිදුකර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | පළාත් මුල්‍ය රීති 407 | - | පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් මුදල් හා ගබඩා සම්බන්ධ පරිපාලන වගකීම් පවරා තිබූ නිලධාරීන්ගෙන් ඇප බැඳුම්කර ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි 110 | - | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත්, යන්ත්‍රෝපකරණ ඒකකය විසින් පාඩු හා හානි ලේඛන පවත්වා නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි 511 | 9,535,076 | සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කාරක පාඩු ආවරණය කිරීම සඳහා වෙන්කිරීම් කර නොතිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ විධිවිධාන | | |
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 6,991,464 | චක්‍රලේඛයේ නියමය පරිදි පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 6 ක් විසින් රජයේ මෝටර් වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ii) | 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුවන්ට හා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු (වැට්) පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) | 2015 මාර්තු 25 දිනැති අංක 01/2015 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය | 925,495 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් උපමාන පාදක ප්‍රදානවල මූලධන කොටසින් පුනරාවර්තන වියදම් දරා තිබුණි. |

## 3. ආදායම් කළමනාකරණය

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 4 ක් තුළ රැස්කරන ලද මුළු ආදායම පහත දැක්වේ.

| විස්තර | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බදු ආදායම | 2,745 | 2,074 | 1,754 | 1,410 | 1,532 |
| බදු නොවන ආදායම | 370 | 157 | 111 | 121 | 116 |
| එකතුව | 3,115 | 2,231 | 1,865 | 1,531 | 1,648 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මුළු ආදායම රු.මිලියන 884 කින් හෙවත් සියයට 28 කින් වැඩිවී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව බදු ආදායම සියයට 32 කින් වැඩිවීම හා රටබීම සැල් වලින් ආදායම් උත්පාදනය සැලකිය යුතු වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මෙම මුළු ආදායම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.152,437,312 කින් උසාවි දඩ මුදල් වැඩිවීම හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 135 කින් සභාවේ බදු නොවන ආදායම වැඩි වී තිබුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂයේ රු.142,648,761 ක අතිරික්තයට ප්‍රතිරූපව සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.23,176,965 ක ඌනතාවයක් විය. විස්තර පහත දැක්වේ.

| | 2016 | 2015 | විචලනය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආදායම | | | |
| බදු | 2,745 | 2,074 | 671 |

| | | | |
|---|---|---|---|
| බදු නොවන ආදායම | 370 | 157 | 213 |
| රජයේ ප්‍රදාන | | | |
| පුනරාවර්තන | 16,757 | 16,268 | 489 |
| මූලධන | 3,658 | 2,547 | 1,111 |
| එකතුව | 23,530 | 21,046 | 2,484 |
| වියදම | | | |
| පුද්ගලික පඩිනඩි | 14,807 | 14,128 | 679 |
| වෙනත් පුනරාවර්තන වියදම | 4,505 | 4,244 | 261 |
| මූලධන වියදම | 4,241 | 2,531 | 1,710 |
| එකතුව | 23,553 | 20,903 | 2,650 |
| අතිරික්තය/ (ඌනතාවය) | (23) | 143 | |

## 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සභාවේ මුළු වියදම රු.මිලියන 23,553 ක් වූ අතර ඉන් රු.මිලියන 19,312 ක මුදලක් පුනරාවර්තන වියදම් සඳහා දරා තිබුණි. එය මුළු වියදමින් සියයට 82 කින් නියෝජනය විය. මුළු පුනරාවර්තන වියදමෙන් රු.මිලියන 14,807 ක මුදලක් පුද්ගලික පඩිනඩි සඳහා දරා තිබූ අතර එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 77 කින් නියෝජනය විය. ඉකුත් වර්ෂයේ ඊට අනුරූප පුනරාවර්තන වියදම රු.මිලියන 18,372 ක් වූ අතර එය එම වර්ෂයේ මුළු වියදමෙන් සියයට 87 කින් නියෝජනය විය.

# 5. විසර්ජන ගිණුම්, අත්තිකාරම් ගිණුම්, අග්‍රිම ගිණුම් හා පොදු තැන්පත් ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

## 5.1 විසර්ජන ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම හෝ කොටසක් උපයෝජනය නොකිරීම, වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන නොමැතිව වියදම් දැරීම, හිඟ බැරකම් ගිණුම්වලින් අත්හැරීම, පුනරාවර්තන වියදම් මූලධන වියදම්වලට අයකිරීම මෙන්ම මූලධන වියදම් පුනරාවර්තන වියදම්වලට අයකිරීම, මූලධන වියදම් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකිරීම, ඉතිරිවීම් සඳහා ප්‍රමාණවත් සහ සතුටුදායක පැහැදිලි කිරීම් ඉදිරිපත් නොකිරීම සහ දෙපාර්තමේන්තු පොත්, පළාත් භාණ්ඩාගාර පොත් සමඟ නොසැසඳීම නැවත නැවත සිදු වී තිබුණු පොදු අඩුපාඩු පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයකට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම් සම්බන්ධයෙන්ද නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම් පිළිබඳ විගණනයේදී පහත සඳහන් අඩුපාඩුද නිරීක්ෂණය විය.

(i) තත්කාර්ය පදනම මත වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් වැය විෂය සංකේත 32 ක් යටතේ සලසන ලද රු.106,774,578 ක ප්‍රතිපාදන පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 09 ක් විසින් සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

(ii) විසර්ජන ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් දෙන ලද උපදෙස්වලට ඇතැම් පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අනුකූල වී නොතිබුණි.

(iii) දෙපාර්තමේන්තු 04 ක විෂයයන් 35 ක් සම්බන්ධයෙන් වර්ෂ 10 කට වැඩි කාලයක් විසර්ජන ගිණුම්වල දැක්වෙන එකතුව රු.49,059,804 ක් වූ පාඩු පිළිබඳව පළාත් මූල්‍ය රීති 69 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | පාඩු විෂයයන් සංඛ්‍යාව | මුදල |
|---|---|---|
| | | රු. |
| කෘෂිකර්ම | 05 | 98,259 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය | 10 | 17,554,713 |
| වාරිමාර්ග | 09 | 21,761,867 |
| සෞඛ්‍ය සේවා | 11 | 9,644,965 |
| | 35 | 49,059,804 |

(iv) සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළ වත්කම් විශාල සංඛ්‍යාවක් අස්ථානගත වී ඇති බව වාර්තා වී තිබුණි. කෙසේ වුවද, බොහෝ දෙපාර්තමේන්තු විසින් එම පාඩු ඔවුන්ගේ විසර්ජන ගිණුම්වල ඇතුළත් කර නොතිබුණු අතර පළාත් මූල්‍ය රීති 69 ප්‍රකාරව පාඩු පිළිබඳ ප්‍රාරම්භක වාර්තා හා අවසාන වාර්තා එම දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(v) විවිධ පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මූලධන වැඩිදියුණු කිරීම් සඳහා දරන ලද රු.1,890,493 ක් වූ මූලධන වියදම් පිළිබඳ විෂයයන් 10 ක් පුනරාවර්තන වියදම් යටතේ සාවද්‍යාව වර්ගීකරණය කර තිබුණි.

**5.2 රාජ්‍ය නිලධාරින් සඳහා අත්තිකාරම් ගිණුම්**

---

හර ශේෂ සඳහා සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින්, අමාත්‍යාංශ 03 කින් හා දෙපාර්තමේන්තු 15 කින් පිටතට මාරු වී ගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නිරවුල් නොකළ ණය ශේෂයට අදාළ රු.18,683,434 ක හර ශේෂයෙන් තථ්‍ය උපලබ්ධි මුදල නිරූපනය වන්නේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. එම නිරවුල් නොකළ ණය ශේෂ පිළිබඳව කටයුතු කිරීම ඉතාම දුර්වල තත්ත්වයක විය.

**5.3 වාණිජ අත්තිකාරම් ගිණුම්**

---

**(i) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙක්කාඩ්ඩිපිලවු ගොවිපොළෙහි එළුවන් 16 ක් මියයාම හේතුවෙන් දරන ලද එකතුව රු.95,625 ක් වූ පාඩු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) ගොවිපොළවල් 3 ක තිබූ වත්කම් විෂයයන් 87 ක් අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ගොවිපොළවල් 2 ක සිදු කරන ලද වටිනාකම රු.1,387,668 ක් වූ මූලධන වැඩිදියුණු කිරීම් වැඩ 5 ක් ජංගම නොවන වත්කම්වල ඇතුළත් කර නොතිබුණි.

**(ii) කර්මාන්ත දෙපාර්තමේන්තුව**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල දක්වා තිබූ එකතුව රු.1,153,342 ක් වූ සමුච්චිත ක්ෂය ආයෝජනය කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) කෙඳි යන්ත්‍රය (fibre machine), ඔතන රෝල් සෙට් (wrapping roll set) සහ රෙදි වියන (looms) යනාදී පාරිභෝජ්‍ය ද්‍රව්‍ය විෂයයන් 23 ක වටිනාකම නිශ්චය කර අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

## 5.4 අග්‍රිම ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබාගන්නා ලද තත්කාර්ය අතුරු අග්‍රිම මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම නිරවුල් කල යුතු වුවද, නිලධාරින් 16 ක් විසින් අවස්ථා 16 කදී ලබාගන්නා ලද රු.336,238 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම මාස 01 සිට මාස 06 දක්වා සැලකිය යුතු කාලපරිච්ඡේදයක ප්‍රමාදයන් සහිතව නිරවුල් කර තිබුණි.

(ii) පළාත් මූල්‍ය රීති 219.2 ට පටහැනිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවස්ථා 07 කදී මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරීන් 06 දෙනෙකුට එකතුව රු.172,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම ගෙවා තිබුණි.

## 5.5 පොදු තැන්පත් ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් එක් එක් අර්ධ වර්ෂයක් අවසානයේ පළාත් මූල්‍ය රීති 571 ප්‍රකාරව ඉකුත් තැන්පතු ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. තවද, අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තු 09 ක එකතුව රු.88,090,458 ක් වූ රඳවා ගැනීම් මුදල්, ඒකජ තැන්පතු, ව්‍යාපෘති අරමුදල් හා ටෙන්ඩර් තැන්පතු නිදහස් කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(ii) මෝටර් වාහන ප්‍රසම්පාදනය හා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් මුදාහරින ලද එකතුව රු.63,884,006 ක් වූ අරමුදල් ප්‍රධාන ලේකම්ගේ, ලේකම් කාර්යාලය විසින් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

## 6. මෙහෙයුම් සමාලෝචනය

## 6.1 කාර්යසාධනය

### (අ) නිශ්චිත අරමුදල් උපයෝජනය

පළාත් සභාවේ වැඩ යෝජනා සංවර්ධනය සඳහා විවිධ ප්‍රභවයන්ගෙන් ලැබුණු අයවැයගත අරමුදල් හා ඒ පිළිබඳ දරන ලද තථ්‍ය වියදම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවයන් පිළිබඳ විස්තර | අයවැයගත | තථ්‍ය වියදම | ඉතිරිය | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) | 3,199,300,000 | 1,800,000,000 | 1,399,300,000 | 57 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 475,000,000 | 437,000,000 | 38,000,000 | 92 |
| අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතිය (ESDP/ TSEP) | 465,000,000 | 289,000,000 | 176,000,000 | 63 |
| උතුරු මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය (NRCP) | 750,090,000 | 515,698,803 | 234,391,197 | 69 |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | 11,350,000 | 7,808,921 | 3,541,079 | 69 |
| යාපනය කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 1,150,000,000 | 582,103,056 | 567,896,944 | 51 |
| ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 1,250,000,000 | 1,235,438,206 | 14,561,794 | 99 |
| සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (HSDP) | 365,000,000 | 365,000,000 | - | 100 |
| පළාත් පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | 150,000,000 | 74,000,000 | 76,000,000 | 50 |
| උතුරු මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය (NRCP) (අතිරේක මූල්‍යයනය) | 1,002,260,000 | 675,335,060 | 326,924,940 | 68 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවල සඳහන් පරිදි පළාත් මූල්‍ය රීති හා පළාත් සභාවේ අවශ්‍යතාවයන් සැලකීමෙන් තොරව අයවැය යෝජනා පිළියෙල කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත මූල්‍ය ප්‍රකාශනවල ශීර්ෂ 29 ක් යටතේ කරන ලද එකතුව රු.1,052,662,907 ක් වූ ප්‍රතිපාදන අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශ 04 ක් හා දෙපාර්තමේන්තු 23 ක් විසින් එකතුව රු.189,381,597 ක් වූ මූලධන වියදම් වාර්ෂික ඇස්තමේන්තුවල එම වියදම් සඳහා ප්‍රතිපාදන නොමැතිව වැයකර තිබුණි. පසුව, අධිහාර ගිණුම මඟින් වර්ෂය අවසානයේදී මෙම වියදම නීත්‍යානුකූල කර තිබුණි.

(ආ) **සුළං ටර්බයින සවිකිරීම මඟින් විදුලි බලය උත්පාදන පිරියත ස්ථාපිත කිරීම**

**--------------------------------------------------------------------------------**

රු.මිලියන 430 ක මූල්‍ය ආධාරය සැලකීමෙන් පසුව 2014 මාර්තු 19 දින සුළං ටර්බයින සවිකිරීම මඟින් විදුලිබල උත්පාදන පිරියත ස්ථාපිත කිරීම සඳහා පුද්ගලික සමාගම් 2 ක් සමඟ උතුරු පළාතේ එක් ලේකම්වරයකු විසින් ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු වර්ෂ 10 සඳහා රු.මිලියන 20 ක් බැගින් වූ රේටයකට හා ඊළඟ වර්ෂ 10 සඳහා රු.මිලියන 23 ක රේටයකට මෙම ව්‍යාපෘතිය සඳහා කුලිය තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පල්ලෙයි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයෙන් ජාතික විදුලිබල පද්ධතියට විදුලිබලය සැපයීම සඳහා 2014 දෙසැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ ඉහත සඳහන් සමාගම් සඳහා රු.මිලියන 2,933.81 ක මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවා තිබුණු නමුත් පසුගිය වර්ෂ 03 ක කාලය තුළ කුලී ලෙස උතුරු පළාත් සභාව සඳහා රු.මිලියන 25 ක මුදලක් පමණක් ලැබී තිබුණි.

(ii) අදාළ අධිකාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව පළාත් දෙපාර්තමේන්තු 02 කට අනුයුක්ත කරන ලද නිලධාරීන් 20 දෙනෙකුට මෙම ආදායමෙන් එකතුව රු. 840,000 ක දිරිදීමනාවක් ගෙවා තිබුණි.

(iii) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා උතුරු පළාතේ ප්‍රධාන ලේකම් විසින් ගිවිසුම අත්සන් කර නොතිබුණි.

(iv) මෙම කාර්යය සඳහා රජයේ ඉඩමක් උපයෝජනය කිරීමට ඉඩම් කොමසාරිස්ගේ අවසරය ලබාගෙන නොතිබුණි.

(v) ගිවිසුම අත්සන් කිරිමට පෙර පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(vi) උතුරු පළාත් සභාව නමින් හෝ උතුරු පළාත් සභාව වෙනුවෙන් අත්සන් කළ ගිවිසුම පළාත් සභාව විසින් අනුමත කර නොතිබුණි.

(vii) මෙම ව්‍යාපෘතියේ අයවැයගත ආදායම හා වියදම 2014 වර්ෂයේ සිට පළාත් සභා අයවැය ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(viii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් පරිසරයට වන බලපෑම අදාළ බලධාරීන් විසින් තක්සේරු කර නොතිබුණි.

**6.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**--------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට අයත් නොවන මාර්ග 4 ක් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 5.1 ක පිරිවැයකට මන්නාරම දිස්ත්‍රික්කයේ ඉදිකර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් කරන ලද තථ්‍ය වැඩ ප්‍රමාණය සැලකිල්ලට ගනු වෙනුවට වැඩවල මිණුම් පදනම් කරගෙන ගෙවීම් කර තිබූ හෙයින් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අවස්ථා 18 කදී කොන්ත්‍රාත්කරුවන්ට රු.1,992,127 ක වැඩිපුර ගෙවීම් කර තිබූ බවත්, මන්නාරම, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය විසින් අභ්‍යන්තර මාර්ගයක් ඉදිකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවකුට රු.231,158 ක වැඩිපුර ගෙවීමක් කර තිබූ බවත් භෞතික පරීක්ෂණයකදී නිරීක්ෂණය විය.

(ඇ) 2012 වර්ෂයේදී ගින්නකින් කඩ සාප්පු විනාශවීම හේතුවෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ කඩ සාප්පු අයිතිකරුවන්ට අත්තිකාරම් ගෙවීමේ අරමුණින් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මන්නාරම නගර සභාවට මුදාහරින ලද රු.මිලියන 6 ක් වූ අග්‍රිමයෙන් රු.මිලියන 4.97 ක මුදලක් 2017 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පුද්ගලික පාර්ශවයන්ට එසේ ගෙවන ලද මුදල් අයකර ගැනීම සඳහා වර්ෂ 5 ක් ගතවීමෙන් පසුවත් අදාළ බලධාරීන් විසින් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. නීති උපදෙස් ලබාගැනීම සඳහා මෙම කරුණ නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බැවින් නීති උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතු බව 2017

සැප්තැම්බර් 07 දින රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට නියෝග කරන ලදී.

(ඈ) ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයේ ඉදිකිරීම් වැඩ නිමකිරීමෙන් තොරව සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,839,239 ක් වටිනා චෙක්පතක් ලියා තිබුණි.

**6.3 දෘශ්‍ය අක්‍රමිකතා**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 1999 ජුනි 01 දිනැති අංක පීඩී/බීපී/9 දරන චක්‍රලේඛය අනුව, පළාත් රාජ්‍ය සේවා නිලධාරීන්ගේ ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරීම රාජ්‍ය සේවයේ අනුරූපී තනතුරු දරන නිලධාරින්ට අදාළ පරිපාටිවලට හැකිතාක් දුරට අනුකූල විය යුතුය. එම චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව එක් එක් ලේකම්වරයකු සඳහා පළාත් සභා අරමුදලින් රු.3,500 ක මාසික විදුලි ගාස්තුව හා රු.15,000 ක මාසික කුලිය ගෙවීම සඳහා ප්‍රධාන ලේකම් විසින් වෙනත් චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. 2017 නොවැම්බර් 07 දින රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් මෙම කරුණ පිළිබඳව සොයාබැලීමට හා හැකිතාක් දුරට ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල විධිවිධානවලට පටහැනි නොවන ආකාරයෙන් කටයුතු කිරීමට ගණන්දීමේ නිලධාරියාහට නියෝග කර තිබුණි.

(ආ) උතුරු පළාතේ ක්‍රීඩා සමාජ අතර බෙදාදීම සඳහා 2016 වර්ෂය තුළදී රු.මිලියන 3 ක වටිනාකමට ක්‍රීඩා භාණ්ඩ 4368 ක් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, ක්‍රීඩා සමාජ අතර එම ක්‍රීඩා භාණ්ඩ බෙදාදුන් බවට කිසිඳු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පළාත් සභාවට ලබාදුන් රු.1,000,000 ක මුදලක් අදාළ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් තොරව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 6.4 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------------

වවුනියා, පුන්තෝට්ටම්හි කාමර 20 ක පහසුකම් සහිතව ගොඩනැගිල්ලක් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පැවතියද, සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ 7 ක් තුළ වවුනියා, සමුපකාර විද්‍යාලය පවත්වාගෙන යාමේ කාර්යය සඳහා සමුපකාර විද්‍යාලය මඟින් කුලී පදනම මත ලබාගත් පුද්ගලික ගොඩනැගිල්ලක් සඳහා කුලී වශයෙන් රු.2,700,000 ක මුදලක් වැයකර තිබුණි.

## 6.5 වත්කම් කළමනාකරණය

-------------------------------

**නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

-----------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තු 10 ක භෞතික සම්පත් පහත විග්‍රහ කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය තුළ නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව තිබෙන්නට ඉඩහැර තිබුණි.

| ආයතනයේ නම | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව තිබූ කාලය |
|---|---|---|---|---|
| | | | රු. | |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | මෝටර් වාහන | 07 | 325,000 | වර්ෂ 03 ට වැඩි |
| | ට්‍රේලර් | 04 | 95,000 | වර්ෂ 05 ට වැඩි |
| | ජල පොම්ප | 09 | 112,000 | වර්ෂ 03 ට වැඩි |
| | යන්ත්‍රෝපකරණ | 02 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 06 ට වැඩි |
| | වෙනත් වත්කම් | 01 | -එම- | වර්ෂ 04 ට වැඩි |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | යන්ත්‍රෝපකරණ | 16 | 3,694,432 | වර්ෂ 03 ට වැඩි |
| | ගොඩනැගිලි | 06 | 35,798,794 | වර්ෂ 02 ට වැඩි |
| | එළු මඩුව හා කුකුල් මඩුව | 04 | 4,695,830 | වර්ෂ 01 ට වැඩි |
| | මෝටර් වාහන | 09 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 05 ට වැඩි |
| | උපකරණ | 1496 | 4,057,993 | වර්ෂ 02 ට වැඩි |
| | ජෙනරේටර් | 05 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 03 ට වැඩි |
| ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | **නිල නිවාස** | | | |

| | | | | |
|---|---|---|---|---|
| | - වවුනියා | 10 | එම | එම |
| | - මන්නාරම | 06 | එම | එම |
| | - කිලිනොච්චි | 30 | එම | එම |
| | - මුලතිව් | 44 | එම | එම |
| | - යාපනය | 01 | එම | එම |
| පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | වෙනත් වත්කම් | 25 | 955,000 | වර්ෂ 02 ට වැඩි |
| | ගොඩනැගිලි | 03 | 16,293,659 | වර්ෂ 02 ට වැඩි |
| ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි - ආහාර හා අත්කම් ගෘහය | 01 | 3,000,000 | මාස 06 ට වැඩි |
| අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | මෝටර් වාහන | 03 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 03 ට වැඩි |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | වැසුණු පාසලේ ඉඩම් හා ගොඩනැගිලි | 90 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 10 සිට 15 දක්වා |
| | මෝටර් වාහන | 15 | එම | වර්ෂ 02 ට වැඩි |
| | වෙනත් වත්කම් | 517 | එම | වර්ෂ 02 ට වැඩි |
| | පන්ති කාමර ගොඩනැගිලි | 03 | 6,513,716 | මාස 06 ට වැඩි |
| පළාත් පාලන දෙපාර්තමේන්තුව | අලුත්වැඩියා කළ නොහැකි භාණ්ඩ | 34 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 04 ට වැඩි |
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | මෝටර් වාහන | 25 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 08 ට වැඩි |
| | අලුත්වැඩියා කළ නොහැකි භාණ්ඩ | 190 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 03 සිට 05 දක්වා |
| | කාන්දුකරණ යන්ත්‍ර හා විවිධ වර්ගයේ උපාංග | 08 | 43,989,506 | මාස 06 ට වැඩි |
| කර්මාන්ත දෙපාර්තමේන්තුව | අල්මාරි | 04 | වටිනාකම ලබාගත නොහැක. | වර්ෂ 02 ට වැඩි |
| | හැන්ඩ්ලූම් | 12 | එම | වර්ෂ 02 ට වැඩි |
| | යන්ත්‍රෝපකරණ | 12 | එම | වර්ෂ 01 ට වැඩි |
| | ජල පොම්ප | 03 | එම | වර්ෂ 01 ට වැඩි |
| | වෙනත් | 09 | එම | වර්ෂ 02 ට වැඩි |

| | | | | | |
|---|---|---|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම් | ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටර් | 02 | | එම | වර්ෂ 02 ට වැඩි |

(ii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යොදාගනිමින් වටිනාකම රු.මිලියන 12.46 කට හා රු.මිලියන 229.69 කට ඉදිකරන ලද පිළිවෙලින් වෙළඳපොලවල් 14 ක් හා වෙනත් මූලධන වැඩ 14 ක් විවිධ හේතූන් මත වර්ෂ 2 කට වැඩි කාලයක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා ගැනීමෙන් තොරව නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු 3 ක භෞතික සම්පත්ද නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවතුණි.

(iv) රු.107,482,000 ක් වටිනා හිමොඩයලිසීස් (Hemodialysis) යන්ත්‍ර 9 ක් සහ වෙනත් විවිධ වර්ගයේ උපාංග යාපනය, මුලතිව්, මන්නාරම හා වවුනියා යන ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල විසින් 2016 දෙසැම්බර් 19 දින මිලදී ගෙන 2017 ජනවාරි 27 දින රෝහල් 9 කට සපයා තිබුණි. එක් එක් රෝහල්වල 2017 මුල් අර්ධ වර්ෂය තුළ නිදන්ගත වකුගඩු රෝගීන් 200 ක් වාර්තා වී තිබුණද මෙම උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කිරීම කෙරෙහි පියවර ගෙන නොතිබුණි. තවද, ඉහත රෝහල්වල පුහුණු මානව සම්පත් නොමැති වීම හා ගොඩනැගිලි පහසුකම් ඇතුළත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් පසුගිය මාස 07 ක කාලය තුළ එම උපකරණ නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි.

රෝහල විසින් ඉල්ලීම් කිරිමෙන් තොරව වෛද්‍ය උපකරණ සපයා ඇති බවත්, එබැවින් විශේෂඥ වෛද්‍යවරයකු, වෛද්‍ය නිලධාරීන් 03 දෙනෙකු, හෙද නිලධාරීන් 03 දෙනෙකු හා ප්‍රමාණවත් පුහුණුවක් සහිත කණිෂ්ඨ සේවකයන් 03 දෙනෙකු පත් කිරීමෙන් තොරව යන්ත්‍රය ක්‍රියාත්මක කළ නොහැකි බවත් මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීන් විසින් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කර තිබුණි.

(v) රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය නොවන සංවිධාන විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහන කිහිපයක අයිතිය ලබාගැනීමට පළාත් සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(vi) පළාත් දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වලින් ප්‍රධාන කොටසක් ඖෂධ පැළෑටි වගා ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කිරීමෙන් තොරව නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ඉඩමේ පිහිටීම | ඉඩමේ මුළු වපසරිය | නිෂ්කාර්ය ඉඩම |
|---|---|---|
| | අක්කරවලින් | අක්කරවලින් |
| නවාකරි | 03 | 01 |
| කල්මඩුනගර් | 100 | 40 |
| නරුවිලිකුලම් | 05 | 05 |
| යෝගාපුරම් | 05 | 05 |
| නයිනමඩු | 05 | 02 |
| එකතුව | 118 | 53 |

(vii) කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත හා කොහු කර්මාන්ත මධ්‍යස්ථාන 9 ක් 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි.

(viii) උතුරු පළාතේ පාසැල් 53 ක් විවිධ හේතූන් මත වසාදමා තිබුණද, එම පාසල්වල ඉඩම්, ගොඩනැගිලි, ලී බඩු හා වෙනත් වත්කම්, වෙනත් කිසිඳු කාර්යයකට යොදාගෙන නොතිබුණි.

(ix) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අරමුදල් වලින් දුෂ්කර හා අඩු ජනගහනයක් ඇති ප්‍රදේශවල රු.මිලියන 459.91 ක මුළු පිරිවැයකට ළමා උද්‍යාන, වෙළඳපොළවල්, බස් නැවතුම්පොළවල්, සාප්පු සංකීර්ණ, පුහුණු මධ්‍යස්ථාන හා සංස්කෘතික ශාලා ආදී සංවර්ධන වැඩ 32 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. තවද, තලෙයි මන්නාරම දුම්රියපොළ, ඉරනයිල්ලුප්පයිකුලම්, පෙරියමඩු හා ආන්දන්කුලම් හි ඉදිකරන ලද සාප්පු සංකීර්ණ හා නල්ලූර් ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ ඉදිකරන ලද ගෘහස්ථ ක්‍රීඩාංගනය හා සංස්කෘතික ශාලාව වර්ෂ 3 කට වැඩි කාලයක් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(x) යාපනය දිස්ත්‍රික්කයේ රු.39,699,199 ක පිරිවැයකට ඉදිකරන ලද පහත සඳහන් වෙළඳපොළවල් 3 ඇතුළත් වෙළඳපොළ ගොඩනැගිලි කිහිපයක් වෙළඳපොළකට නුසුදුසු අවිධිමත් ස්ථානවල ස්ථානගත වීම හේතුවෙන් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

| **වෙළඳපොළේ නම** | **ප්‍රාදේශීය සභාව** | **වටිනාකම** | **නිෂ්කාර්යව තිබූ කාලය** |
|---|---|---|---|
| | | රු. | මාස වලින් |
| තුරෙයියූර් මාළු වෙළඳපොළ | වෙලනෙයි | 10,299,852 | 42 |
| මුත්තාවෙලි වෙළඳපොළ සංකීර්ණය | වෙලනෙයි | 16,729,347 | 6 |
| වෙලනෙයි වෙළඳපොළ | වෙලනෙයි | 12,670,000 | 24 |
| | | 39,699,199 | |

## 6.6 හඳුනාගත් පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1999 සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ සිදු වූ රු.49,059,804 ක් වූ පාඩු සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තු 04 ක් විසින් පළාත් මූල්‍ය රීති 70 (5) ප්‍රකාරව අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| **දෙපාර්තමේන්තුවේ නම** | **පාඩු සංඛ්‍යාව** | **මුදල** |
|---|---|---|
| | | රු. |
| කෘෂිකර්ම | 05 | 98,259 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය | 10 | 17,554,713 |
| වාරිමාර්ග | 09 | 21,761,867 |
| සෞඛ්‍ය සේවා | 11 | 9,644,965 |
| | 35 | 49,059,804 |

(ii) ගැටුම් පැවති කාලපරිච්ඡේදය තුළ අස්ථානගත වූ මෝටර් වාහන 10 ක් හා යන්ත්‍රෝපකරණ 02 ක් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා පියවර ගෙන නොතිබුණි.

**6.7 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුලතිව්, පාඩියන්කුලම්හි රු.2,785,495 ක් වටිනා අත් යන්ත්‍ර ජේෂ කර්මාන්ත සංකීර්ණයේ ඉදිකිරීම් වැඩ සම්බන්ධයෙන් සැලකිය යුතු නිමකිරීමේ කාල ප්‍රමාදයන් නිරීක්ෂණය විය. කෙසේ වුවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 ඡේදය ප්‍රකාරව දඩ මුදල්/ ප්‍රමාණ කළ අලාභ පනවා නොතිබුණි.

(ආ) ප්‍රමාණ කළ අලාභ අයකර නොගැනීම, ඉදිකිරීම් වැඩවල දුර්වල තත්ත්වය, ප්‍රමාණ පත්‍ර විෂයයන් නිමකිරීමෙන් තොරව ගෙවීම් කිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය වූ අතර පහත සඳහන් වැඩ පිළිබඳව කළමනාකරණයට වාර්තා කර තිබුණි.

| **කාර්යයේ නම** | **මුදල** |
|---|---|
| | රු.මිලියන |
| සංස්කෘතික ශාලාව, වවුනියා සිංහල ප්‍රාදේශීය සභාව | 6.71 |
| නව කාර්යාල ගොඩනැගිල්ල වවුනියා සිංහල ප්‍රාදේශීය සභාව | 4.90 |
| මාම්ලුම්කුලම් ට්‍රාන්ස්ෆෝමර් මාර්ගය - වවුනියා සිංහල ප්‍රාදේශීය සභාව | 1.65 |
| නව කාර්යාල ගොඩනැගිල්ල වවුනියා සිංහල ප්‍රාදේශීය සභාව | 14.90 |
| ළමා උද්‍යානය, වවුනියා නගර සභාව | 8.00 |
| | 36.16 |

(ඇ) කයිට්ස් හි ක්‍රීඩාංගනය අලුත්වැඩියා කිරීම සඳහා සිදුකරන ලද ඉදිකිරීම් වැඩ නිම කිරීමේදී අරමුණු කළ කාලපරිච්ඡේදයට දින 85 කට පසුව නිමකර තිබුණි. මේ සම්බන්ධයෙන් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් රු.171,253 ක ප්‍රමාණ කළ අලාභ කොන්ත්‍රාත්කරුගෙන් අයකරගෙන නොතිබුණි.

## 6.8 භාණ්ඩ බෙදාහැරීමේ ප්‍රමාදයන්

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදානවලින් රු.2,109,204 ක වටිනාකමට සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් භාණ්ඩ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභීන් වෙත 2017 ජනවාරි 20 වන තුරුත් බෙදාහැර නොතිබුණි.

## 6.9 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### (අ) ඉදිකිරීම් ආරම්භ කිරීමෙන් හා නිමකිරීමෙන් තොරව චෙක්පත් ලිවීම

වවුනියා දිස්ත්‍රික්කයේ කබඩි ක්‍රීඩාංගනයක් රු.මිලියන 5 ක පිරිවැයකට ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, වියදම් වෙනුවෙන් ඉදිකිරීම් වැඩ ආරම්භ කිරීමට පෙර ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් රු.3,014,206 ක් සඳහා චෙක්පත් 3 ක් ලියා තිබුණි. රු.1,786,341 ක් වටිනා එක් චෙක්පතක් පසුව 2016 සැප්තැම්බර් 14 දින ආදායම් ගිණුමට බැර කර තිබුණු අතර එම කාර්යය සඳහා ලියන ලද අනිත් චෙක්පත් දෙක අරමුණු කළ කාර්යය සඳහා යොදාගැනීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි. කබඩි ක්‍රීඩාංගනය මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිකර නොතිබුණි.

### (ආ) සත්ව ප්‍රජනන ගොවිපොලේ ඵලදායී නොවන ක්‍රියාකාරීත්වය

උතුරු පළාතේ පශු සම්පත් සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතිය යටතේ අනින්වයින්කුලම් සත්ව ප්‍රජනන ගොවිපොළ වැස්සියන් හා පුංගව වසුපැටියන් සහ එළුවන් උපරිම සංඛ්‍යාවක් නිෂ්පාදනය කිරීමේ අරමුණ සහිතව 2013 වර්ෂයේදී අක්කර 50 ක වපසරියකින් යුත් ඉඩමක ස්ථාපිත කරන ලදී. ජාතික ආර්ථිකයට දායකවීමේ අරමුණ සහිතව වාර්ෂිකව කිරි ලීටර් 36,000 ක් හා මස් මෙට්‍රික් ටොන් 25 ක් නිෂ්පාදනය කිරීම සඳහා තවදුරටත් අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද, ගොවිපොළේ ගවයින් 17 ක් හා වසු පැටියන් 08 ක් පමණක් සිටි හෙයින් ගොවිපොළ ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. මේ අතර මෙම ගොවිපොළ කැලෑබද ප්‍රදේශයකට ආසන්නව පිහිටි හෙයින් වල් සතුන් විසින් ගවයින් 08 ක් මරා දමා තිබුණි.

රු.මිලියන 3.7 ක පිරිවැයකට 2003 වර්ෂයේදී මිලදී ගන්නා ලද කිරි ලබාගැනීමේ උපකරණය ගොවිපොළ විසින් උපයෝජනය කර නොතිබූ අතර නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ආදායම ලෙස රු.245,460 ක මුදලක් රැස්කර තිබූ අතර ගොවිපොළේ කටයුතු සඳහා රු.4,632,674 ක මුදලක් දරා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 4.4 ක පාඩුවක් ගොවිපොළට සිදුවී තිබුණි. තවද, රු.මිලියන 1.2 ක් වටිනා එළු මඩුවක්ද ඉදිකර තිබුණි. කෙසේ වුවද, එළු මඩුවේ එළුවන් නොසිටියහ. තවද, ගොවිපොළ ස්ථාපිත කිරීම සඳහා ඉඩමෙන් ඉවත් කරන ලද වඩා වටිනා ගස් පිළිබඳ විස්තර විගණන පරීක්ෂණයේදී ඉදිරිපත් නොකෙරුණි. ගණනය නොකරන ලද වටිනා ගස් පිළිබඳව කිසිදු සටහනක් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි.

## 6.10 උතුරු පළාතේ ක්‍රියාත්මක කරන ලද විදේශ මූල්‍යයන ව්‍යාපෘති පිළිබඳ නිරීක්ෂණ

### 6.10.1 උතුරු මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය (NRCP)

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) කිලෝමීටර් 153.31 ක දිගින් යුත් පළාත් මාර්ග ඉදිකිරීම සඳහා රු.මිලියන 3,530.8 ක් වැයකිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී කිලෝමීටර් 147.65 ක් පමණක් ඉදිකර තිබුණි.

(ii) ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී සංශෝධිත ඇස්තමේන්තුව සියයට 2 සිට 11 දක්වා ප්‍රමාණයකින් මුල් ඇස්තමේන්තුව ඉක්මවා තිබුණි. කෙසේ වුවද සංශෝධිත ඇස්තමේන්තුව සඳහා හේතුව ප්‍රමාණවත් පරිදි පැහැදිලි කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| පැකේජ අංකය | මූල් ඇස්තමේන්තුව (BOQ) | සංශෝධිත ඇස්තමේන්තුව (BOQ) | වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | |
| NP 01 | 369,700,453 | 408,861,959 | 11 |
| NP 03 | 331,858,549 | 337,782,743 | 02 |
| NP 05 | 348,787,303 | 400,388,413 | 15 |

“කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද විස්තරාත්මක සැලැස්ම අධීක්ෂක උපදේශක විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව අනුමත කර තිබූ” බව මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් සඳහන් කර තිබුණි.

## 6.10.2 උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 ක් සඳහා මුදාහරින ලද එකතුව රු.මිලියන 775 ක් වූ ව්‍යාපෘති අරමුදලින් රු.මිලියන 13.8 ක මුදලක් වැයකර නොතිබූ අතර 2016 දෙසැම්බර් 31 දක්වා අදාළ පළාත් පාලන ආයතන විසින් අත රඳවාගෙන තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් දරන ලද වියදමක් ලෙස මෙම මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) මුත්තාවෙලි වෙළඳපොළ ඉදිකිරීම නිමකිරීමේදී වර්ෂ 3 ක ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(iii) මූල්‍ය පාලන පිළිබඳ ගැටලු

- එකතුව රු.90,591,729 ක් වූ වියදම යටිතල පහසුකම් සේවා බෙදාහැරීමේ සංරචකය යටතේ අයකර ගෙන තිබුණි. පසුව කිසිඳු හේතුවක් දැක්වීමෙන් තොරව ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී එම වියදම අධිභාර කර තිබුණි.
- සාමාන්‍ය මහජනතාව විසින් මුදාහරින ලද අප ජලය ඉවත් කිරීම සඳහා පොයින්ට් පේද්‍රුරු නගර සභාව විසින් රු.6,117,905 ක මුදලක් ව්‍යාපෘති අරමුදලින් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම කාර්යය සඳහා ණයදීමේ නියෝජිතායතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iv) එකතු කළ අගය මත බදු (VAT)

කොන්ත්‍රාත්කරුවන්ගේ වැට් ලියාපදිංචි අංකයන් පිළිබඳ වලංගුභාවය තහවුරු කර ගැනීමෙන් තොරව උතුරු පළාතේ ප්‍රාදේශීය සභා 05 ක් විසින් එකතුව රු.3,168,012 ක් වූ එකතු කල අගය මත බදු ගෙවා තිබුණි. එම අංකයන් අක්‍රීය බව පසුව අනාවරණය විය.

## 6.11 මානව සම්පත් කළමනාකරණය

2016 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 6.11.1 පාසල් හැර පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,769 | 1,216 | 553 |
| තෘතියික මට්ටම | 1,625 | 979 | 646 |
| ද්විතියික මට්ටම | 23,005 | 21,439 | 1,566 |
| ප්‍රාථමික මට්ටම | 8,580 | 8,388 | 192 |
| | 34,979 | 32,022 | 2,957 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිපාලන සේවය, සැලසුම් සේවය, තාක්ෂණික සේවය, අධ්‍යාපන පරිපාලන සේවය, විද්‍යාත්මක සේවය, පුස්තකාල සේවය, සංවර්ධන නිලධාරී හා කළමනාකරණ සහකාර සේවය යන සේවාවල පවතින පුරප්පාඩු 2,957 ක් පිරවීමට පළාත් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) වෘත්තීමය නිපුණ නිලධාරියකු හෝ ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ කොමසාරිස්වරයෙකු පත්කිරීමෙන් තොරව පළාත් ආදායම් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(ඇ) පළාත් සභාවේ හෝ වෙනත් ස්ථානයක කිසිඳු රාජකාරියක් ඉටු නොකරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් 5 දෙනෙකුට මාස 2 සිට 6 දක්වා කාලයක් සඳහා වැටුප් ගෙවා තිබුණි.

(ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව පළාත් ඉංජිනේරු සේවා නිලධාරීන් තිදෙනෙකු පත්කර තිබුණි.

(ඉ) කාර්ය මණ්ඩලයට සේවකයන් 50 දෙනෙකු බඳවාගෙන තිබූ අතර පළාත් සභාවේ කාර්යයන්හි නිරත වී තිබුණි. කෙසේ වුවද, මෙම නිලධාරීන් කිසිදු සේවා වර්ගයක් යටතේ නොවීය.

### 6.11.2 පාසැල් අධ්‍යාපන අංශ කාර්ය මණ්ඩලය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (PDE) හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලවල විදුහල්පතිවරුන් හා ගුරුවරුන්ගේ අතිරික්තයක් හා හිඟයක් පැවතුණි. කෙසේ වුවද, පළාත තුළ හිඟයක් පැවති සේවක සංඛ්‍යාව අතිරික්ත සේවකයන්ගෙන් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට සේවක තත්ත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | අනුමත සේවක සංඛ්‍යාව | | තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු | | අතිරික්තය |
|---|---|---|---|---|---|---|---|
| | විදුහල්පතිවරුන් | ගුරුවරුන් | විදුහල්පතිවරුන් | ගුරුවරුන් | විදුහල්පතිවරුන් | ගුරුවරුන් | විදුහල්පතිවරුන් |
| යාපනය | 551 | 8,839 | 561 | 7,740 | - | 1,099 | 10 |
| කිලිනොච්චි | 147 | 2,294 | 96 | 2,008 | 51 | 286 | - |
| මන්නාරම | 158 | 2,258 | 97 | 1,769 | 61 | 489 | - |
| වවුනියා | 215 | 2,770 | 198 | 2,242 | 17 | 528 | - |
| මුලතිව් | 149 | 2,277 | 102 | 1,815 | 47 | 462 | - |
| එකතුව | 1,220 | 18,438 | 1,054 | 15,574 | 176 | 2,864 | 10 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් 5 ක ගුරු තනතුරු පුරප්පාඩු 2,864 ක් පිරවීමට හා විදුහල්පති තනතුරු පුරප්පාඩු 176 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සම්පත් නුවර මහා විද්‍යාලය ජාතික පාසැල, උතුරු පළාත යටතට නොගැනෙන නමුත්, එම පාසැලේ සේවය කරන ලද ගුරුවරුන් 44 දෙනෙකුට හා වෙනත් කාර්ය මණ්ඩලයට වැටුප් ලෙස දළ වශයෙන් රු.2,000,000 ක් ගෙවා තිබුණි.

### 6.11.3 සෞඛ්‍ය අංශයේ කාර්යමණ්ඩලය

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය (PDHS) හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල (RDHS) සෞඛ්‍ය නිලධාරීන්ගේ අතිරික්ත හා පුරප්පාඩු පැවතුණි. කෙසේ වුවද, පළාත ඇතුළත අතිරික්ත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිරවීමට කටයුතු කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා තත්ත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | වෛද්‍ය නිලධාරී | | | දන්ත වෛද්‍ය නිලධාරී | | | හෙද සේවය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
| යාපනය | 218 | 165 | 53 | 37 | 24 | 13 | 246 | 210 | 36 |
| කිලිනොච්චි | 107 | 85 | 22 | 13 | 10 | 03 | 122 | 91 | 31 |
| මුලතිව් | 123 | 69 | 54 | 11 | 07 | 04 | 112 | 93 | 19 |
| වවුනියා | 124 | 75 | 49 | 17 | 12 | 05 | 128 | 121 | 07 |
| මන්නාරම | 149 | 133 | 16 | 14 | 20 | (06) | 218 | 201 | 17 |
| | 721 | 527 | 194 | 92 | 73 | 19 | 826 | 716 | 110 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට විශේෂඥ වෛද්‍යවරු 119 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් විශේෂඥ වෛද්‍යවරු 65 ක් පමණක් පළාතේ සේවය කරමින් තිබුණි.

(ආ) වෛද්‍ය නිලධාරීන් 721 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් 2016 දෙසැම්බර් 31 දිනට වෛද්‍ය නිලධාරීන් 527 ක් පමණක් සේවය කරමින් තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එක් එම්බීබීඑස් වෛද්‍ය නිලධාරියකු හෝ නොමැතිව පර්යන්ත රෝහල් ක්‍රියාත්මකව පැවතුණි.

(ඇ) ප්‍රධාන රෝහල්වල හෙද නිලධාරීන් බොහොමයකගේ ඌනතාවයන් පැවතුණි. අනුමත හෙද නිලධාරී තනතුරු 826 න් 2016 දෙසැම්බර් 31 දිනට පළාතේ හෙද නිලධාරීන් 716 ක් පමණක් සේවයේ නිරතව තිබුණි.

(ඇ) අනුමත විශේෂඥ දන්ත වෛද්‍යවරු 92 ක සංඛ්‍යාවෙන් 2016 දෙසැම්බර් 31 දිනට විශේෂඥ දන්ත වෛද්‍යවරු 73 ක් පමණක් සේවයේ නිරතව සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස පළාතේ පැවති පුරප්පාඩු 19 ක් මෙතෙක් පුරවා නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය නිලධාරී තනතුරු 42 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 6.12 මෝටර් වාහන උපයෝජනය

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලද මෝටර් වාහන 2 ක් 2016 වර්ෂය තුළදී අනතුරුවලට ලක් වී තිබුණි. මෙම වාහන රු.788,450 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළදී පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් අලුත්වැඩියා කර තිබුණි. ඉන් රු.277,285 ක මුදලක් පමණක් රක්ෂණ හිමිකම් මඟින් ලැබී තිබුණි. කෙසේ වුවද, මුදල් රෙගුලාසි 104 හා 110 ප්‍රකාරව රු.511,165 ක් වූ අනතුර මත පාඩුව නිශ්චය කිරීමට දෙපාර්තමේන්තුව අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) මන්නාරම, වවුනියා, කිලිනොච්චි හා මුලතිව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් මෝටර් වාහන බොහෝ ප්‍රමාණයක් අලුත්වැඩියා සඳහා වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් ගරාජවලට භාර දී තිබුණි.

## 6.13 බැංකු සැසඳුම්

-----------------

රු.73,474 ක් වටිනා මාස 6 කට වැඩි කාලයක් ඉදිරිපත් නොකළ චෙක්පත් දෙකක් සම්බන්ධයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළාත් මූල්‍ය රීති 237 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 6.14 පළාත් පාලන ආයතන කටයුතු පිළිබඳ අධීක්ෂණය

----------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කරන ලද අවස්ථා පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | පළාත් පාලන ආයතන සංඛ්‍යාව | තත්ත්වාගණනය කළ විගණන මතය ප්‍රකාශ කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව |
|---|---|---|
| යාපනය | 17 | 17 |
| මුලතිව් | 04 | 04 |
| කිලිනොච්චි | 03 | 03 |
| වවුනියා | 05 | 05 |
| මන්නාරම | 05 | 05 |
| | 34 | 34 |

අදාළ පළාත් පාලන ආයතන සඳහා නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාවල ප්‍රධාන නිරීක්ෂණ සාරාංශ කර පහත දැක්වේ.

(අ) උපයෝජනය නොකළ අරමුදල්

සංවර්ධන වැඩ සඳහා උපයෝජනය කිරීමෙන් තොරව පළාත් පාලන ආයතන 34 ක් විසින් එකතුව රු.1,367,448,670 ක මුදලක් ස්ථාවර තැන්පතුවල තැන්පත් කර තිබුණි.

(ආ) පිජන් නෙස්ට් (Pigeon Nest) අලුත්වැඩියා කිරීම

ඩෙල්ෆට්හි පිජන් නෙස්ට් අලුත්වැඩියා කිරීම සඳහා 2015 වර්ෂයේදී රු.1,292,854 ක මුදලක් වෙන්කර තිබුණි. ඉන් රු.612,401 ක් පමණක් මෙම කාර්යයන් සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව වැයකර තිබුණි. ඉතිරි වැඩ 2018 අප්‍රේල් 10 වන විටත් නිමකර නොතිබුණි.

(ඇ) ඉඩම් හිමිකරුගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව විසින් "මිලියන 1 ක ව්‍යාපෘතිය" (One million project) යටතේ පුද්ගලික ඉඩමක ළමා ක්‍රීඩාංගනයක් ඉදිකර තිබුණි. කෙසේ වුවද, වැඩනිමකරන ලද ළමා ක්‍රීඩාංගනය වර්ෂ 2 කට වැඩි කාලයක් අරමුණු කළ කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි. මහජන ප්‍රවේශය සම්බන්ධයෙන් නගුලේෂ්වරම් කෝවිල් භාරකරුවන් විසින් මල්ලාකම් අධිකරණයේ නඩුවක් ගොනුකර තීරණය ලැබෙන තෙක් සිටින බව මේ සම්බන්ධයෙන් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් දන්වා තිබුණි.

(ඇ) මහනගර සභාව විසින් කරන ලද පත්කිරීම් හා වැටුප් ගෙවීම්

----------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව මහනගර සභාව විසින් කොන්ත්‍රාත් පදනම මත පශු ශල්‍ය වෛද්‍යවරයකු කොන්ත්‍රාත් පදනම මත 2014 මාර්තු 20 දින පත්කර තිබුණි. කෙසේ වුවද, උතුරු පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් පත්වීම අවසන් කිරීමට උපදෙස් දී තිබුණි. එසේ වුවද, 2015 මාර්තු 23 දක්වා පත්වීම අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබූ අතර මෙම නිලධාරියා සඳහා වැටුප් ලෙස රු.419,215 ක මුදලක් ගෙවා තිබුණි.

(ii) මහනගර සභාවේ මූලධන වැඩ පිළිබඳ අධීක්ෂණය සඳහා මසකට රු.35,297 ක වැටුපකට 2014 සැප්තැම්බර් 01 දින සිට 2015 පෙබරවාරි 15 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා කොන්ත්‍රාත් පදනම මත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉංජිනේරුවරයකු පත්කර තිබුණි. කෙසේ වුවද, අනුමැතිය ලබාගැනීමෙන් තොරව ඔහුගේ සේවය 2015 ඔක්තෝබර් 13 දක්වා ලබාගෙන තිබූ අතර, මෙම අනුමත නොවූ කාලපරිච්ඡේදය සඳහා වැටුප් ලෙස රු.421,254 ක මුදලක් ගෙවා තිබුණි. තවද, නිලධාරියා වෙනුවෙන් සපයන ලද ප්‍රවාහන පහසුකම් සඳහා රු.294,840 ක මුදලක් වැයකර තිබුණි.

(iii) අර්ධ පුහුණු සේවකයන්ගේ සේවා ව්‍යවස්ථාවේ නියම කර ඇති වෘත්තීය සුදුසුකම් හා අධ්‍යාපන සුදුසුකම් සැලකීමෙන් තොරව සම්මුඛ පරීක්ෂණය පදනම් කරගෙන විදුලි කාර්මිකයන් 7 දෙනෙකු පත්කර තිබුණි. තවද, කෙටි ලැයිස්තුගත ඉල්ලුම්පත්‍ර 36 කින් ඉල්ලුම් පත්‍ර 23 ක් ප්‍රතික්ෂේප කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් නිවේදනය ප්‍රකාරව එම ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබා තිබුණි.

(iv) යාපනය මහනගර සභාව විසින් 2014 වර්ෂයේදී ගිනි නිවන නිලධාරීන් 10 දෙනෙකු පත්කර තිබුණද නිලධාරීන් තිදෙනෙකු පළාත් ගිනි නිවන සේවා නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාවේ 16.3 වගන්තිය අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ යාපනය මහනගර සභාවේ කළමනාකරණ සහකාරවරයකු විසින් රු.2,934,429 ක මුදල් වංචාවක් සිදුකර තිබුණි. කෙසේ වුවද, රු.320,000 ක මුදලක් පමණක් මෙම නිලධාරියාගෙන් අයකරගෙන තිබුණි.

(ඊ) මහනගර සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි පුද්ගලික බැංකුවක හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතුවල පිළිවෙලින් රු.21,653,627 ක් හා රු.65,150,000 ක් යාපනය මහ නගර සභාව විසින් තැන්පත් කර තිබුණි.

(උ) පහත විග්‍රහ කර ඇති පරිදි යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන කිහිපයක් යටතේ භෞතික සම්පත් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව තිබෙන්ට ඉඩ හැර තිබුණි.

| වත්කම් වර්ගය | ඒකක ගණන |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 05 |
| මෝටර් වාහන | 14 |
| | ------ |
| | 19 |
| | === |

(ඌ) පුනාකරි ප්රාදේශීය සභාව විසින් රු.28,998 ක් වටිනා උපලබ්ධි නොවූ චෙක්පත් 29 ක් රජයේ ආදායමට ප්‍රේෂණය කිරීමෙන් තොරව තැන්පතු ගිණුමට මාරුකර තිබුණි.

(එ) උතුරු නැගෙනහිර නිවාස පුනරුත්ථාපන ව්‍යාපෘතිය විසින් 2004 වර්ෂයේදී ඉදිකරන ලද මන්තායි ප්‍රාදේශීය සභාවේ කාර්යාල ගොඩනැගිල්ල 2009, 2011, 2013 හා 2015 වර්ෂ වලදී රු.මිලියන 4 ක පිරිවැයකට අලුත්වැඩියා කර තිබුණි. පසුව පැරණි ගොඩනැගිල්ල කඩා දැමීමෙන් පසු පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 23.19 ක් වැයකර මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරන ලදී. භාවිතයට ගත නොහැකි තත්ත්වයේ වූ ඉවත් කළ විෂයයන් උපලේඛනගත කර ප්‍රාදේශීය සභා ගබඩාවට භාර දී නොතිබුණි.

(ඒ) උතුරු පළාතේ පළාත් පාලන ආයතනයන්ට අයත් භූමි ප්‍රදේශවල ඉදිකරන ලද දුරකථන කුළුණුවලට අදාළව සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, ආරම්භක සැලසුම් අනුමැතිය, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය යනාදිය සඳහා වර්ග 4 ක් යටතේ අයකිරීම් කළ යුතු විය. කෙසේ වුවද, 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව තක්සේරුව පදනම් කරගෙන එම අයකිරීම් කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඖ) උතුරු පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු කීපයකින් දැන්වීම් ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඕ) උතුරු පළාතේ පළාත් පාලන ආයතන 34 කින් අයකර ගත යුතු එකතුව රු.1,867,898,761 ක් වූ හිඟ ආදායම 2016 දෙසැම්බර් 31 දක්වාත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ක) යාපනය මහනගර සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මකව පැවති බලපත්‍ර නොලත් ප්‍රසිද්ධ සංචාරක හෝටල් 02 කින් වරිපනම් හා බදු අයකරගෙන නොතිබුණි.

(ග) චාවකච්චේරි නගර සභාව විසින් බස් නැවතුම් ස්ථානවලින් අයකරගත යුතු කුලී උතුරු පළාත් ලංකා ගමනාගමන මණ්ඩලයෙන් අයකර ගෙන නොතිබුණි.

(ජ) යාපනය දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 07 ක බල ප්‍රදේශ තුළ පුද්ගලික සමාගම් විසින් ස්ථාපිත කරන ලද සම්ප්‍රේෂණ කුළුණු 32 ක් සඳහා ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය තුළ අයකර ගැනීමෙන් තොරව පැවතුණු එකතුව රු. 813,854 ක් වූ ණයගැතියන්ට අදාළව මහනගර සභාව, නගර සභාව හා ප්‍රාදේශීය සභා 03 ක් විසින් කටයුතු කර නොතිබුණි.

(ඩ) 2013 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය සඳහා ඉඩමක් කුලියට දීමෙන් අයකර ගත යුතු රු.1,014,069 ක් වූ හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 7. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

-------------------------------------

### 7.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාව, පළාත් අමාත්‍යාංශ 5 ක් හා පළාත් දෙපාර්තමේන්තු 27 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

## 7.2 අභ්‍යන්තර විගණනය

----------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (i) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය සහ පළාත් මූල්‍ය රීති 98 ප්‍රකාරව පළාත් දෙපාර්තමේන්තු 5 ක් විසින් අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර නොතිබුණි.

## 7.3 විගණන හා කළමනාකරණ කමිටුව

-----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (I) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වාරයක් හෝ රැස්විය යුතුය. කෙසේ වුවද, දෙපාර්තමේන්තු 06 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් හෝ පවත්වා නොතිබුණි.

## 7.4 උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන්කිරීම

----------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2006 දෙසැම්බර් 22 දින දෙන ලද නියෝගය පදනම් කරගෙන එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන් කරන ලදී. කෙසේ වුවද, වෙන්කිරීම පිළිබඳව හා උතුරු පළාත් සභාව පිහිටුවීම පිළිබඳ ගැසට් නිවේදනය 2016 දෙසැම්බර් 31 දක්වා ප්‍රසිද්ධ කර නොතිබුණි. එවකට වූ උතුරු නැගෙනහිර පළාත් සභාව වෙන්කර වර්ෂ 7 ක් සම්පූර්ණ වීමෙන් පසුව, පත් වූ උතුරු පළාත් සභාව 2013 ඔක්තෝබර් 25 දින පිහිටුවා තිබුණි.

## 7.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

--------------------------------

පළාත් මූල්‍ය රීති 257.2 ප්‍රකාරව හා උතුරු පළාතේ ප්‍රධාන ලේකම් විසින් නිකුත් කරන ලද 2017 ජනවාරි 12 දිනැති අංක පීඑෆ්/ඒපී/01/2017 දරන පළාත් මුදල් චක්‍රලේඛය අනුව 2016 වර්ෂයේ කාර්යයන් පිළිබඳ වාර්ෂික කාර්යසාධන වාර්තාව එක් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 04 ක් විසින් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**7.6 නිරවුල් නොකරන ලද විගණන ඡේද**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයේ විගණන වාර්තාවලින් වාර්තා කරන ලද නිරවුල් නොවූ කරුණු

පෙර වර්ෂ තුළදී නිකුත් කරන ලද මාගේ විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද අක්‍රමිකතා කිහිපයක් නිවැරදි කරගැනීම සඳහා අදාළ බලධාරීන් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(i) දේශපාලන රැඳවුම්කරුවන්ගේ, පුනරුත්ථාපනය කරන ලද රැඳවුම්කරුවන්ගේ හා සිවිල් ගැටුම් හේතුවෙන් මියගිය එල්ටීටීඊ සාමාජිකයන්ගේ පවුල්වල ජීවනෝපාය සඳහා අවශ්‍ය වූ විශේෂ අවශ්‍යතා සඳහා රු.මිලියන 43 ක ගෙවීම් කිරීම.

(ii) වලිකාමම් කලාප අධ්‍යාපන කාර්යාලය විසින් කරන ලද රු.105,345 ක අවිධිමත් වැටුප් ගෙවීම.

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය - II ශ්‍රේණිය හා ශ්‍රී ලංකා ගුරු සේවය සඳහා අවිධිමත් පත්කිරීම්.

(iv) උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ කරන ලද රු.4,418,506 ක වංචනික ගෙවීම.

(v) 2016 මැයි 25 දක්වාත් අදාළ පාර්ශවයන් වෙත ලබාදීමෙන් තොරව වවුනියා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ලියන ලද රු.813,600 ක් වටිනා චෙක්පත් 3 ක් තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(vi) ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලියන ලද රු.9,630,004 ක් වටිනා චෙක්පත් 08 ක් අදාළ පාර්ශවයන් වෙත භාරදීමෙන් තොරව 2016 මාර්තු 31 දින දක්වාත් තැන්පතු ගිණුම්වල තබා තිබුණි.

(vii) මන්නාරම දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන විසින් රු.1,840,390 ක් වූ විශ්‍රාම දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබීම.

(viii) මන්නාරම අධ්‍යාපන කලාපයේ රු.1,735,000 ක් වූ වාහන අනතුරු පාඩු

(ආ) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් 2017 ජුනි 09 දින හා ජුනි 17 දින පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දෙන ලද නියෝගයන් පිළිබඳව අදාළ බලධාරින් විසින් කටයුතු කර නොතිබුණි.

(i) හඳුනාගන්නා ලද පාඩු - රු.17,554,713

(ii) ට්‍රැක්ටර් 10 ක් හා ට්‍රේලර් 05 ක් පිලිබඳ අවිධිමත් ප්‍රසම්පාදනයන් - රු.4,425,000

(iii) පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහන මැෂින් සැපයීම සම්බන්ධයෙන් ප්‍රතිලාභීන් ලැයිස්තුව හා විස්තරාත්මක වාර්තා ඉදිරිපත් නොකිරීම.

(iv) යා/ හින්දු ප්‍රාථමික පාසැල විසින් රු.මිලියන 2.4 ක ඇතුලත්වීමේ ගාස්තු එකතු කිරීම

## 8. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | | | |
|---|---|---|---|
| (i) | ආදායම් පරිපාලනය | - | ඵලදායී උපකරණයක් ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම. |
| (ii) | කොන්ත්‍රාත් පරිපාලනය | - | කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය තුළ වැඩ නිම නොකිරීම. |
| (iii) | මෝටර් වාහන උපයෝජනය | - | හදිසි අනතුරු විගණකාධිපති වෙත වාර්තා නොකිරීම. |
| (iv) | ස්ථාවර වත්කම් පිලිබඳ පාලනය | - | වත්කම් උපයෝජනය හා ස්ථාවර වත්කම් පවත්වාගෙන යාම ඉතා දුර්වල වීම. |
| (v) | අභ්‍යන්තර විගණනය | - | පළාත් දෙපාර්තමේන්තු කිහිපයක අභ්‍යන්තර විගණන ඒකක ස්ථාපිත නොකිරීම. |